# බලලෝභී දේශපාලනයෙන් ජාතික බලවේග දුර්වල කෙරෙයි

ඕනෑම කසිකබල් දේශපාලනඥයකු කියන කියුමක් වන්නේ තමන්ට අවාසිදායක යමක් ඔප්පුකළහොත් තමන් දේශපාලනයෙන් ඉවත්වන බව ය. එහෙත් එසේ ඉවත් වූ දේශපාලනඥයකු ගැන අසා නැති මෙරට ජනතාවට චම්පික රණවක පසුගිය මාර්තු 21 වැනි දා ඉරිදා දිවයින පත්‍රයෙන් එල්ල කර තිබූ ඊනියා අභියෝගය තවත් එක් අභියෝගයක් පමණකි. ඔහු මට කියා ඇත්තේ තමන් ජාතිය මළකඳක් යැයි කියා ඇති බව ඔප්පු කරන ලෙස ය. 1994 වකවානුවේ මැතිවරණයට පෙර, නලින් සිල්වා ජාතිය ගැන කතා කළාට ජාතිය කියන්නේ මළකඳක් එක උස්සන් යන්න බැහැ අපි මේ වෙලාවෙ පොදු පෙරමුණට වැඩකරන්න ඕනෑ යැයි ඔහු කියා ඇත්තේ එවකට ඔහුගේ සංවිධානය වූ ජනතා මිතුරෝ කමිටු රැස්වීමක දී ය. ඒ බව එදා ඒ රැස්වීමේ සිටියෝ දනිති. මට ඒ බව කීවේ එදා ජනතා මිතුරෝ සමග සිට පසුව ඉන් ඉවත් වූ භික්ෂූන් වහන්සේ නමකි. උන්වහන්සේට පසුව කුමක් සිදු විණි ද අද ඔහු සිටින්නේ කොතැනක ද ආදී ප්‍රශ්න මෙහි දී අදාළ නොවේ. ඒ ගැන එතැනින් එහාට යමක් කීමේ අවශ්‍යතාවයක් නැත. කෙසේ වෙතත් ජනතා මිතුරෝ 1994 මැතිවරණයේ දී ආධාර කෙළේ පොදු ජන එක්සත් පෙරමුණට ය.

ඒ චන්ද්‍රිකා කුමාරතුංග යනු කවුරුන්දැයි නොදැන සිටි බැවින් නොවේ. ඇය එවකට පැකේජයක් ගෙනැවිත් නොතිබූ බව නම් සැබෑ ය. එයට හේතුව ඇය ඒ වන විට මහා ඇමතිණියක පමණක් වී සිටි නිසා ය. දේශපාලනයෙහි යෙදෙන්නන්ට යමක් කිව හැක්කේ යම් දෙයක් සිදුවීමෙන් පසුව පමණක් නම් ඒ දේශපාලනයෙහි එතරම් වැදගත්කමක් නැත. චන්ද්‍රිකා කුමාරතුංග යනු කවුද යන්න මෙන් ම ඇය මෙරටට ගෙන්වූ අයගේ අවශ්‍යතාව පිළිබඳව ද අප දැන සිටියේ 1994ට කලින් ය. පැකේජය ගෙන ඒමෙන් පසුව චන්ද්‍රිකා පැකේජයක් ගෙනැවිත් යැයි කෑ ගැසීම ද වැදගත් නමුත් චන්ද්‍රිකා පැකේජයක් ගෙනෙන බව කල්තබා කියා ඒ ගැන ජනතාව දැනුවත් කිරීම හා මැතිවරණයේ දී කළ යුත්තේ කුමක්දැයි නිවැරදිව ප්‍රකාශ කිරීම එයට වඩා වැදගත් ය. චම්පික රණවක අප කී දෙය නොදැන සිටියා නොවේ. ඔහු කලක් චින්තන පර්ෂදයේ රැස්වීම්වලට ද සහභාගි වී ඇත. ඔහු විසින් ලියන ලද අපේ මග නම් කෘතිය ප්‍රකාශ කෙරුණේ ද චින්තන පර්ෂදය මගිනි. ඔහු 1991ට කලින් ටික කලක් ජාතික මතවාදයෙහි සිටියේ ය. ඔහු අද ලියනප්පුලා නමින් අවඥාවෙන් හඳුන්වන්නන්ගේ ලිපිවලින් වැඩක් වී නැතැයි කියයි. එක් අතෙකින් එහි සත්‍යයක් ද වෙයි. ඒ ඔහුගේ ම විකාශය සම්බන්ධයෙන් ගත්කල ය.

පාසල් අවධියේ සිට ම ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනයට සම්බන්ධ වී සිටි චම්පික රණවක 1986-87 අවධියේ අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ නියෝජිතයකු ලෙස, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් ජනතා විමුක්ති පෙරමුණ ද ඇතුළත් ව බිහිකිරීමට ගිය පෙරමුණක සාකච්ඡා සඳහා සහභාගි විය. ඒ සාකච්ඡාවලට සහභාගිවූවෝ එයට සාක්ෂි දරති. පසුගිය දා අනුර බණ්ඩාරණායක මහතා මෙන් ම සෝමවංශ අමරසිංහ මහතා ද මේ සාකච්ඡා ගැන මතක් කර තිබුණි. එවැනි වැදගත් සාකච්ඡාවක් සඳහා අ වි වි ශි බ මණ්ඩලයෙහි නියෝජිතයකු ලෙස ඕනෑම විශ්ව විද්‍යාල ශිෂ්‍යයකුට සහභාගි වීමට නොහැකි බවත් එවැන්නකු ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී අයකු විය යුතුබවත් නොදන්නෝ දේශපාලනයෙහි වෙත් ද? මා 1980 දී මාක්ස්වාදියකු ව සිටි බව චම්පික රණවක ඉරිදා දිවයිනට කියා ඇත. එය සත්‍යයකි. ඒ එසේ නොවේ යැයි මා කිසි දිනක කියා නැත. චම්පික රණවක 1986 දීත් මාක්ස්වාදියෙක් විය. ඔහු ඒ බව දැන් නොකියයි. ඔහු ඉරිදා දිවයිනට කියා තිබුණේ ඔහු කිසි දිනෙක තම අදහස් වෙනස් කරගෙන නැති බව ය. ඔහු මහෞෂධ පඬිතුමා අනුව යමින් ජාතිකත්වය මිට මොළවාගෙන ඉපිද ඇතැයි ජනතාවට ඇඟවීමට උත්සාහ කරයි. මෙහි දී මා වෑයම් කරන්නේ චම්පික රණවක මට පසුවත් මාක්ස්වාදියකු වී සිටි බව කීමට නොවන බව අවධාරණය කළ යුතු ය.

ජාතිකත්ව විවාදවල දී මගේ මාක්ස්වාදී ඉතිහාසය පිළිබඳ ව මුලින් ම කීවේ ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව විසින් විකාශය කරන ලද දෙමළ ජාතිවාදය පිළිබඳ පළමු දේශපාලන සංවාදයෙහි දී වික්ටර් අයිවන් ය. අද චම්පික රණවක වමාරන්නේ එදා වික්ටර් අයිවන් කී දෙය ය. මා එදා වික්ටර් අයිවන්ට දුන් පිළිතුර අදට ද වලංගු වෙයි. මා කියා සිටියේ සිදුහත් තවුසාණන් මුල දී ආළාර කාලාම, උද්දකාරාම පුත්ත ආදීන්ගෙන් ඉගෙනගත් බවත් එහෙත් පසුව ඉන් කැඩුණු බවත් ය. ඒ කැඩීමෙන් පසුව සිදුහත් තවුසාණෝ නැවත ආළාර කාලාමලා සමීපයට නොගිය හ.

© Prof. Nalin De Silva

මාක්ස්වාදයෙන් කැඩී ජාතිකත්වයට පැමිණි මම ඉන්පසු කිසි දිනෙක ජාතිකත්වයෙන් ඉවත් නුණෙමි. ඉන්පසු මම මගේ ශක්ති ප්‍රමාණයෙන් ජාතිකත්ව මතවාද විවිධ ක්ෂෙත්‍රවල ගොඩනගමින් සිටින්නෙමි.

අද චම්පික රණවක කුමක් කීවත් ඔහු මාක්ස්වාදයෙන් කැඩුණේ ඔය කියන ලියනලප්පුලා ලියූ ලිපි කියවීමෙනි. ඒ බව එදා ඔහුට අමාරුවෙන් වුව ද පිළිගැනීමට සිදුවිය. 2001 ජුනි මස 10 වැනි දා ඉරිදා ලංකාදීප පුවත්පත සමග කරන ලද සාකච්ඡාවක දී ඔහු මෙසේ කියා ඇත. 85 වෙන කොට මාක්ස්වාදය යනු ඉටුකරගත නොහැකි මනෝරාජික දෙයක් බව මට අවබෝධ වුණා. ඒ කාලෙ අනුරාධපුරේ කොටි සිදුකල මහා මිනිස් ඝාතනත් එක්ක ජාතික ශිෂ්‍ය බලවේගයක් ගොඩනගන්න අපි පෙළඹුණා. ගුණදාස අමරසේකර, නලින් ද සිල්වා, සූරිය ගුණසේකරලගෙ අදහස් ශක්තියක් වුණා. අපේ ඒ ජාතිකවාදී දේශපාලනය ඔස්සේ යන්න ජවිපෙටත් සිදුවුණා. මෙහි දිනවකවානු ඔහු යොදන්නේ තමන් ස්වයම්භූ ඥානයෙන් මාක්ස්වාදයෙන් කැඩුණු බව පෙන්වීමට ය. එහෙත් ඔහු 1985න් පසුව ද අවිශිබම දේශපාලනයෙහි යෙදුණේ ය. 1985 දී ඔහු ඇතිකල ජාතික ශිෂ්‍ය බලවේගයක් නැත. කොළඹ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් නම් එකල එවැනි ව්‍යාපාරයකට පදනම දමා තිබුණි. අවශ්‍ය නම් මේ පිළිබඳ තවත් කරුණු ඉදිරිපත්කළ හැකි ය. කෙසේ වෙතත් ලියනප්පුලා යැයි පරිභව කරන්නවුන්ගේ මතවාද (අඩුම තරමින් ඔහු හරහා) ජවිපෙටත් බල පෑ බව ඔහුට එදා අමාරුවෙන් වුව ද පිළිගැනීමට සිදු වී ඇත. ඔහු 2001 දී කියා ඇති ආකාරයට නම් ජවිපෙට ජාතිකවාදී දේශපාලනයක් ඔස්සේ යෑමට සිදුවී ඇත්තේ ඔහු සහ ඔහුගේ පිරිස මනිරාසකුලම් හෝ වෙනත් ප්‍රදේශයකට ගිය නිසා නොවේ.

අසූවේ දශකයේ අවසානයේ  අප සමග එකතු වූ චම්පික රණවක 1991 පමණ අපෙන් වෙන්විය. ඒ ආණ්ඩුව විසින් ජවිපෙ මර්දනය කෙරී දුර්වල කරනු ලැබීමත් සමග ය. ඔහු ජවිපෙ දුර්වලවීම නිසා ඇති වූ හිඩැස අවස්ථාවාදීව පිරවීම සඳහා ජාතික මතවාදවලින් කැඩිණි. එසේ කැඩී ජනතා මිතුරෝ නම් සංවිධානය පිහිටුවා ගත්තේ ය.  1993 වන විට ජනතා මිතුරෝ සංවිධානය බටහිර පරිසරවාදී අදහස් හා ඇතැම් මාක්ස්වාදී සංකල්ප  මිශ්‍රකරමින් තනාගන්නා ලද ඊනියා හරිත සමාජවාදී පක්ෂයක් විය. පරිසරය පිළිබඳ අපේ ජාතික මතවාද තිබූ නමුත් ඔහු ඒ නොගත්තේ ය. අප මාක්ස්වාදයෙන් කැඩී ජාතිකත්වයට පැමිණි පසු අපි ජාතිකත්වය අත්හැර නොගියෙමු. එහෙත් චම්පික රණවක එසේ නොවේ. ඔහු අවස්ථාවාදීව තම ස්ථාවර වෙනස් කර ඇත. 1992-93 වන විට ජවිපෙ සාමාජිකයෝ මාක්ස්වාදී මත දැනට වඩා දැරූහ. චම්පික රණවකට අවශ්‍ය වූයේ මාක්ස්වාදී මතිමතාන්තර විශාල ප්‍රමාණයක් ඔළුවේ රඳවාගෙන සිටි ජවිපෙ සාමාජිකයන්ට ආමන්ත්‍රණය කිරීමට ය. එබැවින් ඔහුට නැවතත් මාක්ස්වාදය අවශ්‍ය විය. මාක්ස්වාදයෙන් කැඩී ජාතිකත්වයට පැමිණ නැවත ජාතිකත්වයෙන් කැඩී ඊනියා හරිත සමාජවාදයක් දෙසට යෑම අවස්ථාවාදය නොවේ නම් වෙන කුමක් ද?

ජනතා මිතුරෝ ප්‍රකාශන රාශියක් මා සතු වෙයි. ලිපිය දික්වන බැවින් ඒ සියල්ල උපුටා දැක්විය නො හැකි ය. ජනතා මිතුරෝ පිහිටුවීමෙන් පසුව එහි සංවිධායකයන් ලෙස චම්පික රණවක සහ තවත් තැනැත්තකු (ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙහි දී ජාතික චින්තන මතවාද ඉගෙනගත්තෙක් විය) 1993 අගෝස්තු 29 වැනි ඉරිදා රාවයට මෙසේ කියා ඇත. ඒ (ඔවුන් පිහිටුවීමට බලාපොරොත්තු වූ) රාජ්‍ය පාලනය අප හඳුන්වන්නේ විමධ්‍යගත සමාජවාදී වැඩපිළිවෙළක් ලෙසයි. එම පාලන ක්‍රමය තුළ සියළුම ජනකොටස්වලට තමන්ගේ දේශපාලනය හා සංවර්ධනය පිළිබඳ තීන්දු තමන්ටම ගතහැකි ආකාරයේ ස්වයංපාලනයක් ලැබෙනවා. එසේ වූ දෙමළ ජනයාට තම ජාතික විඥානයෙන් කටයුතු කරගැනීමට ඇති වූ යම්යම් බාධාත් තිබුණු බව අපි පිළිගන්නවා. එකට සිංහල ජාතියත් වගකිවයුතුයි.

ජනතා මිතුරෝ සංවිධානය එකල ජනතා අසිපත නමින් පුවත්පතක් පළකෙළේ ය. එහි 1993 දෙසැම්බර් කලාපයේ මෙසේ සඳහන් වෙයි.  උතුරේ අර්බුදයට දෙමළ ජනයා දෙමළ වීම නිසා ද එමෙන්ම දෙමළ ජනයා සිංහලයන් මෙන්ම ඉංග්‍රිසින් නොවී ලාංකික විම නිසා ද ජාතික ප්‍රශ්නයක් ඇති බව අපි පිළිගනිමු.  අසිපත එසේ කියන්නේ දෙමළ ජනයා දෙමළ වීම නිසා ම ඔවුන්ට වූ ප්‍රශ්නයක් නැති බවත් මෙරට ජනවාර්ගික හෝ ජාතික හෝ ප්‍රශ්නයක් නොමැති බවත් අප කියද්දී ය. ඒ පුවත්පතෙහි ඒ ලිපියෙහි ම අප විවේචනය කෙරෙන්නේ මෙසේ ය. ඊනියා සිංහල බෞද්ධ උරුමය කරපින්නාගත් බලවේග දැන් විජේතුංග යුද්ධය ජයග්‍රහණය කරදෙතැයි යන මායාවේ ගිලී සිටිනවා පමණක් නොව එය ජනතාවට ද ගිල්ලවති.  ඩී බී  විජේතුංග මහතා යුද්ධය ජයග්‍රහණය කර දෙන බවක් අපි කිසිදා නොකීවෙමු. එහෙත්

© Prof. Nalin De Silva

අසත්‍යය චම්පික රණවකගේ එක් ආයුධයක් වෙයි. ඒ කෙසේ වෙතත් ප්‍රභාකරන් යුද්ධයෙන් පරාජය කළයුතු බව හා කළහැකි බව එදා මෙන් ම අද ද අපි කියමු.

1994 අගෝස්තු මැතිවරණයේ දී පොදු පෙරමුණට ආධාර කළ ජනතා මිතුරෝ ඒ අවුරුද්දේ ම දෙසැම්බර් මස පොදු පෙරමුණු ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව ද අසිපතෙහි චන්ද්‍රිකා ආණ්ඩුව කළ යුතු දේ මැයෙන් ලිපියක් පළ කෙළේ ය. එයට අමතර ව 1994 දෙසැම්බර් කලාපයෙහි ම මෙසේ සඳහන් වෙයි.  තවත් අයෙක් කියන්නේ උතුරේ මොනම ජාතික ප්‍රශ්නයක්වත් නොමැති බවත් ලංකාව සිංහලයන්ගේ රට හෙයින් කොටි සංවිධානය හමුදා ප්‍රහාරයන් මගින් විනාශ කරලීම මිස කවර සාකච්ඡාවක්වත් අවශ්‍ය නැති බවයි. පොදු පෙරමුණ හා කොටි සංවිධානය අතර කෙරෙනා සාකච්ඡා සඳහා පලවී ඇති මේ සෑම මතයක් ම අහසේ පවතින මනෝරාජික මතයන් මිස පෙළොවේ පවතින යථාර්ථයන් නොවන්නේ ය.. .. .. .. දෙමළ ජනතාවට තමන්ටම ආවේණික වූ ජාතික ප්‍රශ්න තිබුණේ ය. මෙයින් නොනැවතුණු ජනතා මිතුරෝ ඊනියා යුද්ධයට විරුද්ධව අඩුම තරමින් කොළඹ පුරා පෝස්ටර ඇලවූහ. ඒ බව ඔප්පුකිරීමට නම් මා ළඟ පෝස්ටර නැත.

දෙමළ ජාතිවාදය පිළිබඳ ව 1994 මැතිවරණයට පෙර පමණක් නොව ඉන්පසුව ද එවැනි අදහස් දැරූ මොවුහු 1995න් පසුව නැවතත් අවස්ථාවාදීව තම ස්ථාවරය වෙනස් කළහ. ඒ පැකේජය ගෙන ඒමෙන් පසු එයට විරුද්ධව ජනමතයක් ගොඩනැගෙන අවධියෙහි දී ය. දැන් යුද්ධයට ඉල්ලුමක් තිබේ යැයි කී චම්පික රණවක අර පෝස්ටර, ලිපි සියල්ල එක් රැයකින් අමතක කර නැවතත් ජාතිකත්වය වැළඳ ගත්තේ ය. යුද්ධයට ඉල්ලුමක් ඇතැයි කී කතාව එකල ජනතා මිතුරෝ සංවිධානය සමග සිටි තවත් කොළඹ විශ්ව විද්‍යාලයේ දනියි. ඔහු අද කොළඹින් තරමක් ඈතින් ප්‍රදේශයක නීතිඥයෙක් වෙයි. මාක්ස්වාදයෙන් ජාතිකත්වයට, ජාතිකත්වයෙන් ඉවතට, නැවතත් ජාතිකත්වයට මොහු මාරුවන්නේ අවස්ථාවාදය තම එකම දේශපාලනය වූ බැවින්ය. මිනිසුන් අදහස් වෙනස් කරගන්නා බව සැබෑ ය. එහෙත් මෙලෙස අදහස් වෙනස් කර ගැනීමක් වෙනතක දැකගත නොහැකි ය.

1995න් පසුව මේ කණ්ඩායම ක්‍රියා කර ඇත්තේ මෙරට ජාතික ව්‍යාපාරය තුළට රිංගා එය දුර්වල කිරීමට ය. ජාතික එකාබද්ධ කමිටුව ක්‍රියාත්මක වෙත් දී ජාතික සංඝ සම්මේලනයක් ඇති කර එය කඩාකප්පල් කිරීමේ සිට අද වන තුරු ඇත්තේ භේදකාරි අවස්ථාවාදී දේශපාලනයකි. අවශ්‍ය වුවහොත් පසුව මේ පිළිබඳ කරුණු දක්වමි. මෙරට ජාතික ප්‍රශ්නයක් ඇතැයි එකල පුන පුනා කී චම්පික රණවක සිහල උරුමය පිහිටුවීමෙන් පසුව 2000 සැප්තැම්බර් 24 වැනි දා ලක්බිම පුවත්පත සමග පැවැත්වූ සාකච්ඡාවක දී මෙසේ කියා ඇත.  අපි මුලින් ම ප්‍රශ්නය හඳුනාගත්තොත් තියෙන්නෙ දෙමළ ජාතිවාදය ලංකාව ආක්‍රමණය කරනව කියන එකයි. මේ ඔහු කරුණු තේරුම් ගැනීමෙන් පසුව කියන්නක් නොවෙයි. චින්තන පර්ෂදයේ කටයුතු කළ අයකු ලෙස මේ කරුණු 1987 දී ද දැන සිටියේ ය. එහෙත් ඔහු ඒ සියල්ල පසුකලෙක අමතක කෙළේ ය. 2000 දී පැවැත් වූ ඉහත සඳහන් සාකච්ඡාවේ දී හෝ පසුව ඉතා මෑතක් වනතුරුම හෝ ඔහු සිංහල බෞද්ධකමක් ගැන කතාකර නැත. ඒ සාකචජාවේදීත් ඔහු කියා ඇත්තේ සිංහල කිතුනුවන් ද එකතුකර ගැනීමේ පුළුල් වැඩපිළිවෙළක් ගැන ය. ඔහු සිංහල බෞද්ධකමක් ගැන කතා කිරීමට පටන්ගත්තේ  සෝම හිමියන්ගේ අපවත්වීමත් සමග එක් රොක් වූ ජනතාව දැකීමෙන් පසුව ය. රැල්ලක් ඇතැයි තමන්ට සිතෙන්නේ කොතැනක ද චම්පික රණවක එතැන ඇත.

ඔහු රැලි මත පිහිනීමට උත්සාහකර ඇත්තේ දෙමළ ජාතිවාදය සම්බන්ධයෙන් පමණක් නොවෙයි. කලකට පෙර පශ්චාත්නූතනවාදයට රැල්ලක් ඇතැයි සිතූ ඔහු තරුණ තරුණියන් දිනාගැනීම සඳහා ඒ පසුපස ද ගියේ ප්‍රසිද්ධ ගායකයකු ද සම්බන්ධ කරගැනීමෙනි. සිහල උරුමය පක්ෂයෙහි පශ්චාත්නූතනවාදී රැල්ල කෙතරම් මතු වූයේ ද කිවහොත් ඇතැම්හු ඒ නිසා ම සිහල උරුමය අත්හැරියහ. චම්පික රණවක තම පොතක් දොරට වැඩීමේ උත්සවයකට ආරාධනය කර තිබූ අය ගැන කොළඹ විශ්ව විද්‍යාලයේ ද කැලණිය විශ්ව විද්‍යාලයේ ද ආචාර්ය භික්ෂූන් වහන්සේ කර ඇති ප්‍රකාශ අවශ්‍ය වූ විටක ඉදිරිපත් කරමි. අවශ්‍ය අයකුට දැනට 2001 පෙබරවාරි 25 වැනි ඉරිදා දිවයින ඉරිදා සංග්‍රහයෙන් මේ පොත දොරට වැඩීම පිළිබඳ ව සංස්කෘතික සෝදාපාළුවෝ හෙවත් බස විකුණාගෙන කන්නෝ යන මැයෙන් ලියැවී ඇති ලිපිය කියවිය හැකි ය.

© Prof. Nalin De Silva

චම්පික රණවක හා අතුරලියේ රතන හිමි අහිංසකයෝ නොවෙති. 2000 අගෝස්තු 22 වැනි දා ලක්බිම පුවත්පතේ පළ වී ඇති සාකච්ඡාවක අතුරලියේ රතන හිමි නීතියට විරුද්ධව වැඩ කළොත් අපිත් ආයුධ අතට ගන්නවා යැයි පවසා ඇත. ඒ උන්වහන්සේ ජාතික සංඝ සම්මේලනයේ කටයුතු කරන කාලයෙහි දී ය. අද උන්වහන්සේ ජාතික භික්ෂු සම්මේලනයෙහි කටයුතු කරයි. චම්පික රණවකලා ජාතික හෙළ උරුමයක් නිර්මාණය කර එය ඇතැම් භික්ෂුන් වහන්සේට පූජාකර ඇත. මේ පූජාව ඇතැම් භික්ෂුන් වහන්සේලාට පාර්ලිමේන්තු ආසන තරඟ කිරීම සඳහා ය. මේ දේශපාලනය සම්බන්ධයෙන් මා මැතිවරණය සහ හාමුදුරුවෝ නමින් පොත් පිංචක් ලියා පළකර ඇත. එහි සඳහන් කරුණුවලට අමතරව කිවයුත්තේ මේ දේශපාලනයට එල්ලාවල මේධානන්ද හිමියන් ද කලින් අකමැත්තෙන් සිටි බව ය. දැන් කියැවෙන්නේ භික්ෂුන් වහන්සේගේ දේශපාලනය ගිහි දේශපාලනයෙන් වෙනස් බව ය. මහරගම පැවති භික්ෂු රැස්වීමේ කතා අසා සිටි මට ඇතැම් භික්ෂුන් වහන්සේ කළ කතා ගිහි කතාවලින් නො වෙනස් බව පැහැදිලි විය.

මේ පාර්ලිමේන්තුවේ අමුතු දේශපාලනයක් කිරීමට භික්ෂුන් වහන්සේට නොහැකි ය. යම් අයුරකින් බලය ලැබුණහොත් භික්ෂුන් වහන්සේ හමුදා විසුරුවා නොහරිනු ඇත. හමුදාවේ ප්‍රධාන අණ දෙන නිලධාරියා වනු ඇත්තේ ද භික්ෂුන් වහන්සේ නමකි. ධර්ම රාජ්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරන්නේ කෙසේ ද? එහි විධායක, ව්‍යවස්ථාදායක බලතල හමුදා බලතල ක්‍රියාත්මක වන්නේ කෙසේ ද? මේ භික්ෂු දේශපාලනය විද්‍යාලංකාර ප්‍රකාශයට හා සිංහල සම්ප්‍රදායට එකඟ නොවෙයි. මෙහි ඇත්තේ කණ්ඩායම් දෙකක සන්ධානයකි. එක් කණ්ඩායමක් මෙරට භික්ෂුන් වහන්සේට හිමි ගරුත්වය හා බලය නැතිකිරීමට ක්‍රියාකරන විජාතික බලවේග විසින් මෙහෙයවනු ලැබෙයි. උන්වහන්සේලා ඒ බව දන්නා බවක් මෙයින් ගම්‍ය නොවෙයි. මේ බ්‍රිතානි ආණ්ඩුකාරයන්ගේ කාලයේ සිට විජාතික බලවේගවලට අවශ්‍ය වූ දෙයකි. ඒ කණ්ඩයමේ භික්ෂුන් වහන්සේ විචිත්‍ර ධර්ම කථිකයෝ වෙති. එහෙත් උන්වහන්සේ සෝම හිමියන්ගේ අපවත්වීමට පෙර ජාතික ප්‍රශ්න සම්බන්ධයෙන් මැදිහත් නොවූහ.

අනෙක් කණ්ඩායමෙන් දේශපාලන පක්ෂ පූජාව වී ඇත. චම්පික රණවක හෝ සිහල උරුමය පක්ෂයක් ලෙස හෝ සෝම හිමියන් අපවත්වීමට පෙර සිංහල බෞද්ධකමක් ගැන කතා නො කෙළේ ය. දැන් ඔවුහු සිංහල බෞද්ධ රාජ්‍යයක් ගැන කතාකරති. ඔවුහු මැතිවරණය සඳහා භූමිපුත්‍ර පක්ෂයේ අදහස් හා සටන්පාඨ සොරාගත්හ. මේ චම්පික රනවකගේ අවස්ථාවාදී රැලි දේශපාලනයයි. මෙහි ඇත්තේ බල ලෝභය මිස ජාත්‍යාලයක් නොවෙයි. මේ බල ලෝභය මනාව දැකගත හැකි වූයේ එස්. එල්. ගුණසේකර මහතා සම්බන්ධ සිද්ධියෙහි දී ය. චම්පික රණවකගේ බලලෝභී දේශපාලනයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ කෙරී ඇත්තේ ජාතික ව්‍යාපාරය බෙදා දුර්වල කිරීම ය. ජාතික හෙළ උරුමයේ කණ්ඩායම් දෙක අතර භේදයක් ඇතිවීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි.

© Prof. Nalin De Silva